පල්ලේපොල ප්‍රාදේශීය සභාව
මාතලේ දිස්ත්‍රික්කය
----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 07 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 28 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
--------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පල්ලේපොල සතිපොල ඉදිකිරීමේ වටිනාකම රු.116,500 ක් වැඩියෙන්ද, ළමා උද්‍යාන ආරක්ෂක වැට ඉදිකිරීම් වටිනාකම රු.409,682 ක් අඩුවෙන්ද ප්‍රාග්ධනිත කර තිබුණි.

(ආ) පල්ලේපොල සතිපොල සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාල ණයගැති ශේෂය රු.288,589 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ නිලන්නෝරුව පන්සල අසල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, සභාව විසින් ක්‍රියාත්මක කිරීම මඟින් ලැබූ ආදායම ණයහිමි ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් සභාවේ ආදායම රු.95,000 ක් අඩුවෙන් හා කර්මාන්ත ණයහිමියෝ සමාන වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) නාලන්දා ජලාශයේ යෝධ නිදිකුම්බා ඉවත් කිරීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කාර සංවිධානය වෙත තවදුරටත් ගෙවීමට ඇති මුදල රු.230,300 ක් අඩුවෙන්ද, ප්‍රතිපූර්ණය වියයුතු මුදල රු.130,256 ක් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඉ) 2014 දෙසැම්බර් 31 දින වන විටත් කඩා ඉවත්කර තිබූ ගොඩනැගිලි 03 ක පිරිවැය වූ රු.143,800 ක් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.2 ලැබියයුතු ගිණුම්

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 10ක එකතුව රු.20,989,288 ක් වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.763,245 ක ශේෂ 08ක් ඊට ඇතුළත්වී තිබුණි.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 12ක එකතුව රු.15,412,363ක් වූ අතර, වර්ෂ 03කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.1,876,265ක ශේෂ 5ක් ඊට ඇතුළත්වී තිබුණි.

1.3.4 නීති, රීති රෙගුලාසි හා චක්‍රලේඛ ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) (i) වගන්තිය | පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතිය නොමැතිව සේවකයින් තුන්දෙනෙකු බඳවාගෙන රු.505,000 ක් දීමනා ගෙවා තිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 1987 න් පසු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,629,934 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,310,597ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,319,337ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉඩම් විකිණීම් මත බදු

------------------------

සභා බලප්‍රදේශයේ එකමුතුගම අගලවත්ත මහ කුඹුරේ පිල්ලැව නැමැති ඉඩම 2010 වර්ෂයේදී කොටස්කර විකිණීම මත අයවියයුතු සියයට 1 ක බදු මුදල් වලින් රු.38,625 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පරිසර ආරක්ෂණ බලපත්‍ර

----------------------------

2000 අංක 53 සහ 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව අංක 1533/16 දරන 2008 ජනවාරි 25 දිනැති පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් නිවේදය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ වෙළඳ බලපත්‍ර ලබාගෙන තිබුණු පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළ යුතු ව්‍යාපාර 8 ක් සඳහා එම බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(ඇ) ජල ගාස්තු

------------

අළුත්ගම ජල යෝජනා ක්‍රමයේ ජල සැපයුම් විසන්ධි කළ ජල පාරිභෝගිකයින් 5 දෙනෙකුගෙන් අයවිය යුතු රු.13,134 ක හිඟ ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වරිපනම් බදු

--------------

2015 දෙසැම්බර් 31 දින හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.171,797 ක් වූ අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර හිඟ වරිපනම් මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වශයෙන් රු.181,830 ක මුදලක් හා මුද්දර ගාස්තු වශයෙන් රු.8,139,347 ක මුදලක් අයවිය යුතුව තිබුණි. මෙම උසාවි දඩ ශේෂය තුල 2011 වර්ෂයට අදාල හිඟ රු.26,000 ක් ද විය.

(ඊ) වෙනත් ආදායම්

-------------------

2015 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.29,301 ක් වූ අතර හිඟහිටි කසල ගාස්තු ශේෂය රු.72,456 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය සභාවට අනුයුක්තව වැඩ අධිකාරිවරයෙකු සිටියදී පල්ලේපොල නගර සංවර්ධන වැඩ සටහන - 2015 යටතේ ගොඩනැගිලි සැලසුම් සකස් කිරීම වෙනුවෙන් බාහිර පුද්ගලයෙකුට රු.32,252 ක දීමනාවක් ගෙවා තිබුණි.

(ආ) සභා කාර්යාලය පිහිටි භූමිය නීත්‍යානුකූලව පවරා නොගැනීම හේතුවෙන් සභාවට විරුද්ධව පවරා තිබූ නඩු 2ක් සඳහා 2015 දෙසැම්බර් 31 දින දක්වා නීතිඥ ගාස්තු රු.161,500 ක් සභා අරමුදලින් වැකර තිබුණි.

(ඇ) සභාවේ බැකෝ යන්ත්‍රය නිවසක් මතට පෙරලීම හේතුවෙන් එම නිවසට හා යන්ත්‍රයට පිළිවෙලින් රු.212,734 ක හා රු.1,177,955 ක අලාභයක් සිදුවී තිබූ අතර, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර අනතුරට වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කර නොතිබුණු අතර, අදාල නිවස අළුත්වැඩියා කර දීමද සිදුකර නොතිබුණි

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-----------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පල්ලේපොල නගරයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය පිහිටුවීමට ගොඩනැගිලි පහසුකම් සපයා නොගෙන ඒ සඳහා රු.1,249,840 ක් වැයකර අවශ්‍ය ලී බඩු හා පරිගණක උපකරණ මිලට ගෙන තිබූ අතර, ඒවා පූර්ණ උපයෝජනයකින් තොරව පැවතුණි.

(ආ) මොණරවිල වේරවත්තේගම "ග්‍රීන් වැලි ගාර්ඩ්න්ස්" (Green Valley Gardens)ඉඩම් වෙන්දේසියේදී සභාව සඳහා පොදු කටයුතු වෙනුවෙන් වෙන්කර තිබූ බිම් කොටස් දෙක වර්ෂයකට වැඩි කාලයක් ගතවී තිබුණද, පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) පාරිභෝගිකයින් 50 දෙනෙකු සඳහා ජල මනු සවි නොකර, රු. 200 ක ස්ථාවර මාසික ගාස්තුවක් අයකර තිබූ අතර, පාරිභෝගිකයින් 173 දෙනෙකුගේ ජල මනු ක්‍රියා විරහිත වී තිබූ නමුත්, අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 අවිධිමත් ගණදෙනු

---------------------

(අ) මධ්‍යම පළාතේ, පළාත් පාලන කොමසාරිස්වරයාගේ 2015 මාර්තු 12 දිනැති අංක 2015/02 දරන චක්‍රලේඛයේ විධිවිධාන හා සීමාවලට පටහැනිව සභාවේ වැඩ අධිකාරිවරයාට රු.11,750 ක සංයුක්ත දීමනාවක් සහ රු.20,892 ක සැතපුම් කුලියක් ගෙවා තිබුණි.

(ආ) 1992 පෙබරවාරි 26 දිනැති අංක 05/01/119 ටෙ.ix දරන නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ විධිවිධාන වලින් බැහැරව රාජකාරී වේලාවන් තුල පැවැත්වූ සැලසුම් කමිටු 03 ක් සඳහා නිලධාරීන් 09 දෙනෙකු වෙත රු.10,000 ක කමිටු දීමනා ගෙවා තිබුණි.

(ඇ) මධ්‍යම පළාත් පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ඔක්තෝබර් 21 දිනැති අංක සීපීසී/සීඑම්එස්/1/6/14 දරන ලිපිය ප්‍රකාරව අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකර විශ්‍රාමික තාක්ෂණික නිලධාරියෙකු සේවයේ යොදවා ගෙන 2015 අප්‍රේල් දක්වා රු.172,000 ක මුදලක් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ඈ) 2014 පළාත් නැගුම සංවර්ධන වැඩසටහන යටතේ ටී.බී.තෙන්නකෝන් අනුස්මරණ ළමා උද්‍යානයේ භූමිය හා වැට සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ගෙවීම් කිරීමේ දී ලබාදුන් අත්තිකාරම් මුදල අඩු නොකර අතරැදවුම් දක්වා මුළු මුදලම ගෙවා තිබීම හේතුවෙන් රු.190,000 ක පාඩුවක් සිදුව තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

පල්ලේපොල නගර සංවර්ධනය යටතේ ව්‍යාපෘති 4ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.40,000,000ක ප්‍රතිපාදන අනුමත කර තිබූ අතර, ඉන් රු.3,500,000 ක ප්‍රතිපාදන මත ඉදිකිරීමට යෝජනා කර තිබූ බහුකාර්ය ගොඩනැගිල්ල 2 අදියරේ ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණි. නාගරික රැස්වීම් ශාලාව වැඩිදියුණු කිරීමේ හා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා පිළිවෙලින් රු.649,551 ක් හා රු.249,324 ක් වැයකර තිබූ නමුත්, ඉදිකිරීම් අතරමඟ නවතා තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

------------------------------

නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

----------------------------------------

වර්ෂ 20 කට වැඩි කාලයක සිට අබලන්ව ගාල්කර තිබෙන කැබ්රථයක් හා අත්ට්‍රැක්ටරයක් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි

4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

-----------------------------------------

4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂය තුලදී ආදායම් හා වියදම් විෂයයන් අතර, ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. එහිදී ආදායම් විෂයයන් 36 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර, සියයට 33 සිට සියයට 1335 අතර පරාසයක විචලනයන් ද වැය විෂයයන් 17 ක ඇස්තමේන්තුගත වියදම සහ තථ්‍ය වියදම අතර, සියයට 34 සිට සියයට 95 ක් අතර පරාසයක විචලනයන්ද පැවතුණි.

4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

1988 (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ක්‍රමයක් පවත්වා නොතිබුණි.

4.3 විගණන හා කළමනාකරණ කමිටු

-------------------------------------

2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීපී/සීඑල්/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) මානව සම්පත් කළමනාකරණය